සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2017**
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න  විභාග අංකය ..........................

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



(01) මෙහි දැක්වෙන සිතුවම ඇතුලත් වන්නේ ........................................................................ විහාරයේ ය.

(02) ........................................................ විසින් දන්ත ධාතූන්වහන්සේ වැඩම කරනු ලබන අවස්ථාව දැක්වෙයි.

(03) මෙම සිතුවම නිර්මාණය කිරීමේ දී ........................................................ ශිල්ප ක්‍රමය භාවිත කර ඇත.

(04) ........................................................ශිල්පියාගේ විශිෂ්ටතම නිර්මාණයක් ලෙස නම් කළ හැකිය.

(05) සුවිශේෂී සම්ප්‍රදායකට කර ඇති මෙම සිතුවම ........................................................ යුගයට අයත්ය.

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(06) ඇම්බැක්කේ දේවාලයේ පියස්සේ පරාල 26ක් එකට සම්බන්ධ කරන ලී ඇණය හඳුන්වන නම කුමක් ද? ........................................................

(07) ගඩලාදෙනිය විහාරය අයත්වන යුගය කුමක් ද? ........................................................

(08) බොරැල්ල ගෝතමී විහාරයේ චිත්‍ර නිර්මාණය කරනු ලැබූ ශිල්පියා වන්නේ කවුද?

.........................................................................................................

(09) නිරුඩ ගණයට අයත් සත්ත්ව රූපයක් නම් කරන්න..........................................................

(10) "සුදු කුකුළා" නැමති චිත්‍රය නිර්මාණය කළ ශිල්පියා කවු ද? ..........................................

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

(11) කලා වැවට නුදුරින් අවුකන නම් ග්‍රාමයේ නිර්මාණය කර තිබෙන අවුකන පිළිමයේ කලා සම්ප්‍රදාය වශයෙන් හඳුනාගෙන ඇත්තේ,
(1) ගුප්ත කලා සම්ප්‍රදාය යි (2) පල්ලව කලා සම්ප්‍රදාය යි
(3) අමරාවතී කලා සම්ප්‍රදාය යි (4) ගාන්ධාර කලා සම්ප්‍රදාය යි

(12) අද්විතීය නිර්මාණයක් වූ සීගිරිය නිර්මාණය කළ රජතුමා වන්නේ,
(1) කාශ්‍යප රජුය. (2) වලගම්බා රජුය.
(3) ධාතුසේන රජුය. (4) දුටු ගැමුණු රජුය.

(13) සන කැපීම, පායම් පෑහීම යන අවස්ථාවන් පිළිවෙළින් භාවිත කරනු ලබන්නේ,
(1) ලාක්ෂා කර්මාන්තයේ දී ය. (2) පිත්තල කර්මාන්තයේ දී ය.
(3) මැටි කර්මාන්තයේ දී ය. (4) වෙස් මුහුණු කර්මාන්තයේ දී ය.

(14) පොළොන්නරු යුගයට අයත් හොඳම සඳකඩ පහණ පිහිටා ඇත්තේ,
(1) පොළොන්නරු ගල් විහාරයේ ය.
(2) පොළොන්නරු වටදාගේ ඉදිරිපිට ය.
(3) තිවංක පිළිමගෙය ඉදිරිපිට ය.
(4) නෙලුම් පොකුණ අසල ය.

(15) පනාවිටිය අම්බලම ප්‍රචලිතව ඇත්තේ,
(1) පිත්තල කැටයම් නිසා ය. (2) ගල් කැටයම් නිසා ය.
(3) දැව කැටයම් නිසා ය. (4) ඇත්දත් කැටයම් නිසා ය.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/ වචන යොදා සම්පූර්ණ කරන්න.**

(16) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ප්‍රංශයේ ලැස්කෝ ගුහාව තුළ නිර්මාණය කර ඇත්තේ ................................................... රූප සමූහයකි.

(17) දුෂ්කර ක්‍රියාව නැමති ................................................... සම්ප්‍රදායට අයත් බුද්ධ ප්‍රතිමාව ඉන්දියානු මූර්ති අතර අති විශිෂ්ට නිර්මාණයකි.

(18) තිවංක පිළිමගෙයි ගර්භ ගෘහයෙහි දක්නට ලැබෙන ................................................... තිවංක හැඩයෙන් යුතුව නිම වූවකි.

(19) ලියනාඩෝ ඩාවින්චි ශිල්පියා විසින් නිර්මාණය කරනු ලැබූ දැනට ලූවර් කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති කාන්තාවකගේ උඩුකය චිත්‍රය ........................................................ නමින් හැඳින්වේ.

(20) ඇත් වෙසින් පැමිණ විනායගර් වල්ලි එළවාගෙන යන අවස්ථාව දැක්වෙන චිත්‍රය ........................................................ ශිල්පියාගේ නිර්මාණයකි.

- අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල දී ඇති රූප සටහන් කොටස් හා සමීප සබඳතාවයක් දක්වන රූප සටහන, ඉදිරියෙන් දී ඇති **A, B, C, D, E** රූප සටහන් අතුරින් තෝරාගෙන අදාළ අක්ෂරය තිත් ඉරිමත ලියන්න.

(21) 

A  (...............)

(22) 

B  (...............)

(23) 

C  (...............)

(24) 

D  (...............)

(25) 

E  (...............)

අංක 26 සිට 30 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

(26) ස්ථපතිරායර් : ..............................................................................................

..............................................................................................

(27) කුරුළු කලාල : ..............................................................................................

..............................................................................................

(28) විද්‍යාධර ගුහාව : ..............................................................................................

..............................................................................................

(29) සිරස්පත : ..............................................................................................

..............................................................................................

(30) ෆ්‍රෙස්කෝ බුවනෝ : ..............................................................................................

..............................................................................................

- 31 සිට 35 දක්වා දී ඇති ප්‍රශ්න වලට **F, G, H, I, J** යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


F


G


H


I


J

(31) F අක්ෂරයෙන් දක්වෙන නිර්මාණය කළ ශිල්පියා කවු ද? ..............................................

(32) G අක්ෂරයෙන් දක්වෙන චිත්‍රයේ නිර්මාණ ශිල්පියා කවු ද? ..............................................

(33) H අක්ෂරයෙන් දක්වෙන නිර්මාණය අයත් ශෛලිය/ශිෂ්ටාචාරය කුමක් ද? ..............................................

(34) I අක්ෂරයෙන් දක්වෙන චිත්‍රය නිර්මාණය කර ඇති ස්ථානය නම් කරන්න.

..............................................

(35) J අක්ෂරයෙන් දක්වෙන මූර්තිය නිර්මාණය කළ ශිල්පියා කවු ද? ..............................................

• පහත දී ඇති රූප සටහන පිළිබඳව අංක 36 සිට 40 දක්වා දී ඇති උපශීර්ෂ යටතේ වාක්‍ය 05 කින් කලාත්මක ඇගයීමක් කරන්න.



(36) ස්ථානය : ..............................................................................................................................

..............................................................................................................................

(37) ශිල්පියා : ..............................................................................................................................

..............................................................................................................................

(38) තේමාව : ..............................................................................................................................

..............................................................................................................................

(39) ශිල්ප ක්‍රමය : ..............................................................................................................................

..............................................................................................................................

(40) හැඟීම් ප්‍රකාශනය : ..............................................................................................................................

..............................................................................................................................

(ලකුණු 1X 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි.

- ඔබේ විභාග අංකය/ නම උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර දෙන විට එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසි විය හැකි ය.
- දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- සියලු ම ද්‍රව්‍ය ඇස් මට්ටමෙන් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දන්වීමට ඔබට අවසර තිබේ.

නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා සුදුසු කඩදාසියක් භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
ඔබේ චිත්‍ර ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

රේඛා අධ්‍යයනය

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා

වර්ණ චිත්‍රය

2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම
3. පරිමාණ, පර්යාලෝක රීති හා කලාත්මකව සම්පිණ්ඩනය වීම
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

සැලකිය යුතුයි.

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

(ලකුණු 30)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2017**
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper | III | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:
(i) ඔබ ඇඳිය යුත්තේ එක චිත්‍රයක් පමණි.
(ii) ඔබේ විභාග අංකය/ නම හා ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලිව ලියන්න.
(iii) උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
(iv) දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකිය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
(v) මෝස්තර නිර්මාණයේ දී විනු කඩදාසි භාවිත කිරීමට අවසර ඇත.

- පහත සඳහන් තේමා අතුරින් එක් තේමාවකට පමණක් චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.

### "අ" කොටස - <u>ප්‍රකාශන චිත්‍ර</u>

(01) මත්ස්‍ය සම්පත රැගෙන වෙරළට පැමිණි ධීවරයෝ
(02) නිවසේ පැවති ආගමික කටයුත්තක අවස්ථාවක්
(03) ගොවිපලේ අස්වනු නෙළන කාන්තාවක්

### "ආ" කොටස - <u>ග්‍රැෆික් චිත්‍ර</u>

(04) නත්තල් උත්සවයක් හෝ උපන්දින උත්සවයකට සුදුසු තෑගි දවටනයක් සැලසුම්කර වර්ණ කරන්න.
(05) ළමා පොත් කවරයකට සුදුසු නිර්මාණය කර වර්ණ කරන්න.
(06) අලුතින් හඳුන්වාදෙන රූපවාහිනී නාලිකාවකට සුදුසු ලාංඡනයක් නිර්මාණය කරන්න.

### "ඇ" කොටස - <u>මෝස්තර චිත්‍ර</u>

(07) ළමා ඇඳුමකට සුදුසු රෙද්දකට ගැලපෙන සරල හැඩ යොදා ව්‍යාප්ත මෝස්තරයක් සැළසුම්කර වර්ණ කරන්න.
(08) සත්ත්ව රූප යොදා අලංකරණය කරන ලද තිර රෙද්දකට ගැලපෙන සැලැස්මක් ඇඳ වර්ණ කරන්න.
(09) උත්සව අවස්ථාවක භාවිත කළ හැකි පතාකයක් සැලසුම් කර වර්ණ කරන්න.

(ලකුණු 30)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2017
# Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

ගුරුභවතුන්ට/ අදාල උපදෙස් අනුව ලබා දී ඇති ද්‍රව්‍ය සමූහය ද්‍රව්‍ය බලා ඇඳීමේ සංරචනයකට උචිත පරිදි සකස් කර ඇඳීමට සලස්වන්න.

(01) 6 × 12 × 10 ට ආසන්න ප්‍රමාණිත පෙට්ටියක් සුදු කොළයක් අලවා තබන්න.

(02) මිලි ලීටර් 750 පමණ විනිවිද පෙනෙන සාමාන්‍ය විදුරු බෝතලයක් වතුර 3/4 පුරවා එයට වර්ණවත් ක්‍රෝටන් අත්තක් දමා තබන්න.

(03) තැඹිලි ගෙඩියක්

(04) ඉරි සහිත රෙදි කැබැල්ලක් (වර්ණ 02 පමණ)

(05) අඟල් 20 × 16 පමණ ලෑල්ලක් (ආධාරකය සඳහා)

